Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# දකුණු පළාතේ සමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක මඟින් හෙළිවන අතීත විදේශීය ආර්ථික සබඳතා.

**අසංක බුද්ධිකසිරි**[1]

**මාලිංග අමරසිංහ**[2]

## සංක්ෂේපය

පුරාවිද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රයේම තවත් එක් අනු විෂයයක් ලෙස ජලාශ්‍රිත පුරාවිද්‍යාව හැඳින්විය හැක. ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ මධ්‍යගතව පිහිටා තිබෙන නිසාත්, මෙරට පවතින භූගෝලීය හා පාරසරික සාධක පදනම් කරගෙන ප්‍රාග් ඓතිහාසික, මුල ඓතිහාසික, ඓතිහාසික, මධ්‍ය කාලීන, හා පශ්චාත් මධ්‍ය කාලීන යුගයන්වල සිට විදේශීය රටවල් සමඟ වෙළඳ සම්බන්ධතා පැවැති බවට පුරාවිද්‍යාත්මක මෙන්ම සාහිත්‍ය මුලාශ්‍රය සාධක බොහොමයක් මඟින් අනාවරණය වේ. ඒ අනුව මෙහි මූලික ගැටලුව ලෙස ජාත්‍යන්තර වෙළඳාම තුළ ශ්‍රී ලංකාවට හිමි වූ විශේෂ අවධානය පිළිබඳ සාධක සනාථ කිරීම සඳහා සමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක කෙසේ දායකවේද? යන්න අධ්‍යයනය කරනු ලැබේ. ආර්ථික සංකල්පයක සිට බලන කල ශ්‍රී ලංකාව විදේශීය රාජ්‍යයන් සමඟ කටයුතු කිරීමට පටන් ගත්තේ මූල ඓතිහාසික යුගයේ සිට වූවත් එහි වඩා වර්ධනයක් පෙන්නුම් කරනු ලබන්නේ ඓතිහාසික යුගයේ සිටය.ඓතිහාසික, මධ්‍ය කාලීන, හා පශ්චාත් මධ්‍ය කාලීන යුගයන්වල බොහෝවිට මේ ස්වභාවය අතිශය වර්ධනය වී ඇති බව සාධක විමර්ශනයෙන් පෙනීයයි. මුහුදු පුරාවිද්‍යාත්මක සාධක මඟින් මෙම ආර්ථික සබඳතා සනාථ කරන පැහැදිලි සාක්ෂි දක්නට ලැබේ. මෙහිදී දිවයින වටා පිහිටි වරායන් අතිශය වැදගත් වන අතර එමඟින් ජාත්‍යන්තර ආර්ථිකමය සබඳතා පිළිබඳ තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වලින් පැහැදිලි වේ. මේ අනුව මෙම නිබන්ධනයේ මූලික අරමුණ වන ශ්‍රී ලංකාව විදේශීය රටවල් සමඟ පැවති ආර්ථික සබඳතා හෙළිකරන සමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක බොහොමයක් විමර්ශනාත්මක ලෙස අධ්‍යයනය කරමින් ජාත්‍යන්තර වෙළඳාම තුළ ශ්‍රී ලංකාවට හිමි වූ විශේෂ අවධානය පිළිබඳ තොරතුරු ගොනු කළ හැකිය. මෙම අධ්‍යයනය සඳහා අදාළ වන මුලාශ්‍රමය දත්තයන් එක්රැස් කරනු ලැබේ. එය ප්‍රාථමික දත්ත සහ ද්විතීයක දත්ත රැස්කිරීම යන ආකාර දෙක යටතේ සිදු කරයි. ප්‍රාථමික දත්තයන් රැස්කර ගැනීමේ දී ක්ෂේත්‍ර අධ්‍යයන සටහන් තබා ගැනීම, සමුද්‍ර පුරාවිද්‍යා සාධක විශ්ලේෂණය හා සම්මුඛ සාකච්ඡා ආදිය යොදා ගන්නා අතර ද්විතීයක දත්තයන් රැස්කිරීමේ දී පුස්තකාල පරිහරණය ආශ්‍රිත පොත් පත් සඟරා අන්තර්ජාල භාවිතය ආදිය යොදා ගනිමි. අධ්‍යයනයෙන් ලබාගත් අවසන් ප්‍රතිඵලය බහුවිධ මාධ්‍ය සහ මුද්‍රිත මාධ්‍ය භාවිත කර පර්යේෂණ ක්‍රියාවලිය සහ උපකල්පන දත්තයන් අනුමාන ඉදිරිපත් කිරීම සිදුකරනු ලබයි.

*1. පුරාවිද්‍යාව, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*